(විරිඳු පංතියක්)

# සොඳුරු ළමා වියෙන් බිඳක්

1. මල්ලි:- අක්ක මගේ රත්තරන්
අක්කා:- මල්ලි මගේ රත්තරන්
දෙදෙනාම:- අපි දඟ කළ බාල කාලෙ
අපි දෙන්නට රත්තරන
අපි දෙන්නට රත්තරන්

2. මල්ලි:- පුංචි අක්කෙ මට මතකයි අපේ පුංචි කාලේ
පුංචි පුංචි දඟ වැඩ කර හැංගි හිටිය තාලේ
හැංගි හිටිය තාලේ
අක්කා:- පොඩි මල්ලියෙ මට මතකයි අත් අල්ලා දෙන්නා
පුංචි කුරුළු පැටව් වගේ වෙල් එලියට පැන්නා
වෙල් එලියට පැන්නා

3. මල්ලි:- දිය මංකඩ පිපී දිලෙන ඕළු නෙළුම් නෙළලා
මාල ගොතා හුරතලේට අත-කර සරසාලා
අත-කර සරසාලා
අක්කා:- ගොටුකොළ - තණපලා නෙළා අම්මගෙ හිත දිනලා
දොල පහරේ - මහ නියරේ තරඟෙට දුව පැනලා
තරඟෙට දුව පැනලා

4. මල්ලි:- ඉපනැල්ලේ ගොයම් කරල් ඇහින්දෙ අපි දෙන්නා
වක්කඩ ළඟ තිත්ත පැටව් ඇල්ලුවෙ අපි දෙන්නා
ඇල්ලුවෙ අපි දෙන්නා
අක්කා:- පොඩි මල්ලියෙ ඔයත් එක්ක පලවා බිය සංකා
සිරිපා කඳුවැටි බලන්න ගස් මුදුනට නැංගා
ගස් මුදුනට නැංගා

5. මල්ලි:- තාත්ත ගහ යටින් යද්දි අපි නිහඬව උන්නා
අක්කෙ ඔයා මගෙ දිවියට අත්වැල වී උන්නා
අත්වැල වී උන්නා
අක්කා:- ගොරක ගහේ වෙරළු ගහේ පල දරනා කාලේ
අපි දෙන්නා රජ වීලා හිටිය බාල කාලේ
හිටිය බාල කාලේ

6. මල්ලි:- ගං වතුරේ පොල්ගෙඩි බැඳ එගොඩට පීනාලා
මෙගොඩට පෙරලා ආවේ අපි තරඟෙට වැදිලා
අපි තරඟෙට වැදිලා
අක්කා:- ගං වතුරේ දිය සුළියක යනවිට මා ගිලිලා
ඔයා නේද මා බේරුවෙ වීරය වගෙ පැනලා
වීරය වගෙ පැනලා

7. මල්ලි:- සැඩ පහරේ කෙසෙල් කඳන් පහුරු සදා පාවී යන්න
පෙරළි පෙරළි වතුරට පැන මාළු පැටව් හඹා යන්න
මාළු පැටව් හඹා යන්න
අක්කා:- මගෙ එඩිතර පොඩි මල්ලිය කළ විස්කම් මතකයි
මගෙ දිවියට සෙවනැල්ලක් වී සිටියා මතකයි
වී සිටියා මතකයි

8. මල්ලි:- වෙලේ ළිඳෙන් නාලා කුරු පොල් ගහකට නැගලා
කුරුම්බ ගෙඩි ළිඳට දමා හොර රහසේ බීලා
හොර රහසේ බීලා
අක්කා:- කජු වාරෙට පාන්දරින් හොරෙන්ම නැගිටිනවා
වවුලන් කෑ පුහුලන් කජු පින්නෙම ඇහිදිනවා
පින්නෙම ඇහිදිනවා

9. මල්ලි:- රබර් යායෙ සටපට ගා කටු පුපුරන්නා
ඔට්ටුපාළු බෝල තනා අපි දුව පැන්නා
අපි දුව පැන්නා
අක්කා:- කොට්ටන් ගෙඩි එකතු කරන් අව්වේ වේලාලා
තලලා මද කැවා අපි රසකර තලු මරලා
රසකර තලු මරලා

10. මල්ලි:- තරඟෙට අපි සරුංගෝල උඩුගුවනට යැව්වා
තරඟ වෙවී යාළු වෙවී නූල් ඇදන් දිව්වා
නූල් ඇදන් දිව්වා
අක්කා:- කොලු නඩයේ පෙරමුන ගෙන මහ වනරොද පීරා
දං බෝවිටි හිඹුටු සොයා ගියෙ බඩවැටි පීරා
ගියෙ බඩවැටි පීරා

11. මල්ලි:- වෙසක් දිනේ පැටව් පිරුන අටපට්ටම් තනලා
මරඟන දූවරු රඟනා සල් උයනක් මවලා
සල් උයනක් මවලා
අක්කා:- බුදුරැස් විහිදෙන විදිහට විදුලි බුබුලු දමලා
ඔයා නේද හැඩවැඩ කළෙ නෙක විසිකම් මවලා
නෙක විසිකම් මවලා

12. මල්ලි:- පැලඉනි වැට බැඳලා පොඩි සෙල්ලම් ගේ හදලා
පොල් අතු අහුරා හොඳහැටි වහලෙ සෙවිලි කරලා
වහලෙ සෙවිලි කරලා
අක්කා:- පෝය දාට කැළණි ගිහින් ගෙනා වළං තියලා
අම්මා දුන් හාල් මිටෙන් රස බොජුනක් හදලා
රස බොජුනක් හදලා

13. මල්ලි:- සෙල්ලම් ගෙයි අපි එක්වී අලදෝසිත් හැදුවා
සව් ඇට බැද පැණි දාගෙන මතකද අපි කෑවා
මතකද අපි කෑවා
අක්කා:- අන්නසි අඹ කපලා හොඳ පදමට ලුනු දමලා
වෙරළු තම්බලා එක්කර අච්චාරුව හදලා
අච්චාරුව හදලා

14. මල්ලි:- කජුගහ මැද දෙබලට වී හැංගී රහසින්නේ
නිදැල්ලේ එහෙ මෙහෙ ගියානෙ දඟ වැඩ කරමින්නේ
දඟ වැඩ කරමින්නේ
අක්කා:- මිදුලේ උගුරැස්ස ගහේ ගෙඩි රතු වෙන කාලේ
වවුලන් සේ දවස පුරා ගහේ හිටිය තාලේ
ගහේ හිටිය තාලේ

15. මල්ලි:- හුරතල් අපෙ බලු පැටියා මළ දවසේ අඬලා
මතකද අපි පෙරහැරකින් ගෙනගියෙ බෙර ගහලා
ගෙනගියෙ බෙර ගහලා
අක්කා:- අවුරුදු කාලෙට කජු ගහෙ ඔන්චිල්ලා බැඳලා
මල්ලිව ඉන්දා පැද්දුවෙ ඔන්චිලි-චිලි කියලා
ඔන්චිලි-චිලි කියලා

16. මල්ලි:- පුංචි කාලෙ මා නාවා ගුලිකර බත් කවලා
උකුලෙ තියා නිදි කරවා දොයි දොයි දොයි කියලා
දොයි දොයි දොයි කියලා
අක්කා:- පියාගෙ ඔවදන් අහලා පාඩම් වැඩ කරලා
අපි දෙන්නා දුව පැන්නා අස්ස ගුඩුං කියලා
අස්ස ගුඩුං කියලා

17. මල්ලි:- කොළපත උඩ මං නැගලා අල්ලාගෙන උන්නා
අක්ක මාව ඇදගෙන ගොස් පෙරලාගෙන පැන්නා
පෙරලාගෙන පැන්නා
අක්කා:- කොස් කොළ තොප්පියක් හිසට මිරිවැඩි සඟලක් දෙපයට
බඳ පටියක් ඉන වටේට කඩුවක් අරගෙන සුරතට
කඩුවක් අරගෙන සුරතට

18. මල්ලි:- හිමිදිරියේ වෙලට ගොසින් වක්කඩ බැඳ එන්නේ
තේජවන්ත රජෙකු වගේ තාත්ත සිහි වෙන්නේ
තාත්ත සිහි වෙන්නේ
අක්කා:- දිවා රැයේ වෙහෙස වෙලා රස බෝජන හදලා
අපෙ ආදර රන් අම්මා සිහිවෙයි මට මැවිලා
සිහිවෙයි මට මැවිලා

19. මල්ලි:- රෑ බෝ වීගෙන එනවිට පඩිපෙල ළඟ ඉඳගන්නේ
පියඹා යන මා වවුලන් ගනිමින් අප හඬ දුන්නේ
ගනිමින් අප හඬ දුන්නේ
අක්කා:- පැණි වරකා ගෙඩිය කපා සමසේ අපහට දුන්නේ
අපෙ ආදර රන් අම්මා මල්ලියෙ මට සිහි වන්නේ
මල්ලියෙ මට සිහි වන්නේ

20. මල්ලි:- හඳපානේ කමතෙ ගොයම් පාගන ඒ දිනයේ
නිදි මරමින් කී සීපද ඇහෙනව මේ සමයේ
ඇහෙනව මේ සමයේ
අක්කා:- අම්බරුවන් ගොයම් කොළය වටේට කැරකෙනවා
සංසාරේ අපි හැමදෙන දිවිමග කැරකෙනවා
දිවිමග කැරකෙනවා

21. මල්ලි:- අනේ අක්කෙ ඒ කාලය අයෙයෙත් නෑ එන්නේ
මතකයෙ සුවඳක් පමණයි නැවුම්ව ළංවන්නේ
නැවුම්ව ළංවන්නේ
අක්කා:- දඟ වැඩ කර හුරතල් වුණ අපෙ සුමිහිරි බාලේ
හීනෙන් ඉඳහිට පේනව මල්ලියෙ මේ කාලේ
මල්ලියෙ මේ කාලේ

22. දෙදෙනාම:- සංසාරේ හැම භවයෙම අත් බැඳ අපි දෙන්නා
අක්ක මලෝ වාගේ යමු නිවන් පුරට දෙන්නා
නිවන් පුරට දෙන්නා
නිවන් පුරට දෙන්නා
නිවන් පුරට දෙන්නා

අපේ ළමාවියේ මතක සටහන්
හිඹුටානේ
කල්‍යාණී සෙනරත් යාපා
2004 නෙවෙම්බර් 30